## පෙර වදන

1955 – 1975 දක්වා වූ විසි වසර තුළ සිංහල කාව්‍යය අංශ කිහිපයක් ඔස්සේ විමර්ශනයට ලක් කිරීම මෙම නිබන්ධනයෙන් සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යය යි.

උක්ත කාල පරිච්ඡේදය තුළ දී කවිය අන් කිසි ලෙසකත් නො වූ විරූ තරම් විපර්යාසයට භාජන වූ බව අමුතුවෙන් කිව ඕනෑ නො වෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එය විවිධත්වයෙන් හා විචිත්‍රත්වයෙන් යුතු පුළුල් සාහිත්‍යාංගයක් බවට පත් විය. එසේ ද වුව මේ අවධිය පිළිබඳ ව කිසි යම් ශාස්ත්‍රීයතූ අතින් ප්‍රමාණවත් විග්‍රහයක් සිදු වූයේ නැතැ යි සිතමි. මාර්ටින් වික්‍රමසිංහගේ <u>නව පද්‍ය සිංහලය</u>, ආරිය රාජකරුණ–ගේ <u>නූතන සිංහල කාව්‍යය – 2</u>, ගාවින් කරුණාරත්නගේ <u>සිංහල කවියේ නව යුගය</u> යනාදි විචාර කෘති මගින් ද පරීක්ෂාවට භාජන වී ඇත්තේ 60 දශකයේ ආරම්භක වසර කිහිපයක් දක්වා පමණකි. මොනිකා රුවන්පතිරණගේ <u>නව කවි විමසුම</u> අද්‍යතන සමය ද නියෝජනය වන පරිදි සම්පාදනය කරන ලද්දක් නමුදු, එය සංක්ෂිප්ත විමසුමක ස්වරූපය උසුලන්නක් බව පෙනෙයි. ඇතැම් කවීන් හෝ, කෘති හෝ, කාව්‍ය ගණ හෝ පිළිබඳ ව කෙරුණු විචාර පුවත්–පත් සඟරා ආදියෙහි වරින් වර පළ වී ඇති නමුදු, විධිමත් බවකින් යුතු ව එබඳු සංග්‍රහයක් ද පළ නො වී ය. මේ නිබන්ධනය සම්පාදනය කරන ලද්දේ මෙම තත්ත්වය ද යම් පරමිකින් සැලකිල්ලට ගනිමිනි.

යථෝක්ත කාල පරිච්ඡේදය තුළ දී බිහි වූ නිර්මාණ මෙහි ලා සාකච්ඡාවට ලක් කරන ලද්දේ විශේෂයෙන් කවියේ ප්‍රවණතා පිළිබඳ ව අවධානය යොමු කරමිනි. මෙහි ඇතුළත් පරිච්ඡේද පසෙන් පළමු වැන්න අද්‍යතන කවියේ පසුබිමත්, එහි ආරම්භය හා විකාසන ස්වරූපයත් පිළිබඳ ව කරුණු සලකා බැලීමට යෙදෙයි. කවියේ විකාසනය විමසී–මේ දී ගුණාත්මක ව මෙන් ම ප්‍රමාණාත්මක ව ද වැදගත් වන හෙයින් ඒ දෙ අංශය පිළිබඳ

ව ම එහි දී සැලකිල්ලක් දක්වා ඇත. දෙ වන පරිච්ඡේදය වෙන් වනුයේ නවීන අනුභූති ප්‍රකාශනය සම්බන්ධයෙන් නූතන කාව්‍ය නිර්මාණවල පවත්නා විශේෂතා පරීක්ෂා කිරීම සඳහා ය. එහි දී 1960 ගණන්වලින් පසු ව පළ වූ නිර්මාණ වෙන් ව ගෙන විමසන ලද්දේ ද කවියේ ප්‍රවණතා පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීමේ අටියෙනි. තුන් වන හා සිව් වන පරිච්ඡේද සිංහල කාව්‍ය සම්ප්‍රදාය හා අද්‍යතන නිර්මාණ අතර ඇති සම්බන්ධය විමසීමට වැය වෙයි. නූතන කවීන් සම්භාව්‍ය හා ගැමි යන දෙ අංශය කෙරෙන් ම ආභාසය ලබා ගැනීමට යෙදූ ප්‍රයත්නය කෙතරම් දුරට ඵල ගැන්වී ඇද්ද යන්න එහි ලා සාකච්ඡා කෙරෙනු ඇත. පස් වන පරිච්ඡේදය නව කවීන්ගේ ජීවන දෘෂ්ටිය විමසීමට කැප වෙයි.

මෙම නිබන්ධනය සම්පාදනය කිරීමේ දී උපදේශකවරයා වශයෙන් කටයුතු කළේ කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ මහාචාර්ය මිහිඳුවන් පී. - පිලකරත්න මහතා ය. කාරුණික ගුරූපදේශයෙන් සහාය කළ එතුමාට මා බෙහෙවින් ණය ගැති බව සඳහන් කළ යුතු ය.

එසේ ම රුහුණු විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ අධිපති මහාචාර්ය විනී විතාරණ මහතා දුන් උපදෙසුත්, කළ අයුරින් කළ උපකාරත් මට විශාල ආශීර්වාදයක් වූ බව කෘතඥ ව සිහිපත් කරමි.

කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය ආනන්දසේන මුදියන්සේ, සිංහල අධ්‍යයන අංශාධිපති ආචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු සහ ආචාර්ය ඊ. ඒ. අබයසිංහ, ආචාර්ය සෝමරත්න බාලසූරිය යන ආචාර්යවරු ද මේ සම්බන්ධ ලෙවලුදු ඇති වූ හැම විටෙක දී ම මට පිහිට වූහ.

ඒ පිළිබඳ ව කරුණු සාකච්ඡා කරමින්, ඇතැම් විට මා සිත නො යෙදුණු

පැන් ගැන ද විමසීමට අනුබල දුන් ශාස්ත්‍රපති කෝත්ගස්දෙනියේ ආනන්ද හිමිපාණන්ට හා කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ කථිකාචාර්ය පීනදාස දහන්සූරිය මහතාට ද, මේ සඳහා තම අනුරින් සහයෝගය දී මා දිරි ගැන්වූ වතවාසල පුරාණ විහාරාධිපති ශාස්ත්‍රවේදී කොටුවිල විමලකීර්ති හිමිපාණන්ට හා මාතර නාවිමන මහා විහාරාධිපති නාවිමන සමිද්ධි හිමිපාණන්ට ද, අවසාන අත් පිටපත් සකස් කර ගැනීම ඇතුළු කුඩු මහත් සෑම කටයුත්තක දී ම සහෝදරත්වයෙන් උපකාර කළ ශාස්ත්‍රවේදී ඇත්ගාල්මුල්ලේ පඤ්ඤාලංකාර, ශාස්ත්‍රවේදී හිරාණේ විමලකිත්ති යන හිමිවරුන්ට හා ශාස්ත්‍රවේදී ඇස්. ඒ. පද්මසිරි, උපාධි අපේක්ෂක ජෝතිපාල ජේරත් යන මහතුන්ට ද, යතුරු ලිවීමේ කටයුතු මැනවින් කර දීමට වෙහෙස වූ වල්. දිසානායක මහතාට ද මාගේ කෘතඥතාව පිරිනැමේ.

අකුරුගොඩ ධම්මින්ද හිමි.

සිංහල අධ්‍යයන අංශය,
රුහුණු විශ්ව විද්‍යාලය,
මාතර.

1986 මැයි 10.